# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 160 — 1975 අප්‍රේල් 18 වැනි සිකුරාද — 1975.04.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටු | | පිටු |
|---|---|---|---|
| පනත් ... ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | අතිරේකය | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 48 |
| ශ්‍රී ලංකා තැපැල් මහාධිකරණයේ දැන්වීම් ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු හැසි පිළිබඳ නිවේදන ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | 47 | විවිධ දැන්වීම් ... ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | | |


## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

### බලංගොඩ අධිකරණ සීමාව තුළ සංචාරක උසාවි පැවැත්වීම

පැල්මඩුල්ලේ සංචාරක මහේස්ත්‍රාත් උසාවිය පහත සඳහන් දිනයන්හි පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරමි. (මේ දිනයන් සංශෝධනය කිරීම් වලට යටත්ව ය.)

| 1975 | සඳුද දිනය | අඟහරුවාද දිනය |
|---|---|---|
| ජූලි | ... 7, 14, 21, 28, | ... 1, 8, 15, 29, |
| අගෝස්තු | ... 4, 11, 18, 25 | ... 5, 12, 19, 26 |
| සැප්තැම්බර් | ... 1, 8, 15, 22, 29 | ... 2, 9, 16, 23, 30 |
| ඔක්තෝබර් | ... 6, 13, 20, 27 | ... 14, 21, 28 |
| නොවැම්බර් | ... 3, 10, 17, 24 | ... 4, 11, 25 |
| දෙසැම්බර් | ... 1, 8, 15, 22, 29 | ... 2, 9, 16, 23, 30 |

එල්. එච්. ජී. වීරසේකර,
බලංගොඩ මහේස්ත්‍රාත්.

1975 අප්‍රේල් මස 03 වන ද,
බලංගොඩ, මහේස්ත්‍රාත් අධිකරණයේදී ය.

4-394—75.4.18 දින අංක 160 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## බස්නාහිර පළාත

### පානදුර දිස්ත්‍රික් උසාවි නඩු කාලාවේදිය

පිළියන්දල, හොරණ පාරේ, අංක 54හි පදිංචි මුනිදාස විජේසූරිය ........................පැමිණිලිකාරයා.

නොම්මරය : 12752. එදිරිව

පිළියන්දල, මාම්පේ, රෝහල පාරේ අංක 9හි පදිංචි තෙල්ගේ ලීලාරත්න ........................විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරු තෙල්ගේ ලීලාරත්නට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1975 ක් වූ මැයි මස 08 දින පෙ. ව. 10ට පිළියන්දල, ඉඩම පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ යයි දෙන බව මෙයින් දන්වනු ලැබේ.

මෙම ඉඩම් කොටස විකුණනු ලබන්නේ ඉහත සඳහන් නඩුවේ විත්තිකරුගෙන් පැමිණිලිකරුහට අයවිය යුතු රු. 4,165 සහ 1974.01.31 සිට මුදල් ගෙවා අවසන් වන තෙක් රු. 4,280 කට සියයට පහ බැගින් පොලිය අයකර ගැනීමත් සඳහාය.

#### විකුණනු ලබන දේපල

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, පිළියන්දල නගර සභා සීමාව තුළ මාම්පේ ජය මාවතේ වරිපනම් අංක 15/21 දරණ කැකුණගහවත්තේ නැගෙනහිර පැත්තේ බෙදා වෙනස් කරන ලද ඉඩම් කට්ටියට මායිම් :—උතුරට : දියෙස් අල්විස්ට අයිති ඉඩම, නැගෙනහිරට : ජෝති කුලපතිව අයිති ඉඩම, දකුණට : අඩි පාර ද, සහ බස්නාහිරට : රජය විසින් මිලයට ගෙන තිබෙන මෙම ඉඩමේම කට්ටියක් ද යන මෙකී මායිම් තුළ පර්චස් අටයි, සියයෙන් පංගු අසූ හතක් (අ. 0, රූ. 0, පර්. 8 87/100) විශාල ඉඩමේ බිමෙන් සහ සියලු ගහකොළ පලතුරු ආදියෙන් නොබෙදූ 3/4ක් සහ උළු සෙවිලි කළ ගෙය සම්පූර්ණයෙන්ම ද වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් කාර්යාලයේ ඇම්. 728/91හි ලියාපදිංචි වී ඇත.

ජේ. බී. ද සිල්වා,
පිස්කල්,
දිස්ත්‍රික් උසාවිය, පානදුර.

වර්ෂ 1975 අප්‍රේල් මස 03 දින,
පානදුර දිස්ත්‍රික් උසාවියේ දීය.

4–426—75.04.18 දින අංක 160 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වෙනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

### 1975

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් ... | 04.04.75 | සිකුරාද ... | 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද ... | 04.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද ... | 11.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද ... | 18.04.75 | සිකුරාද | දවල් 12.00 |
| මැයි ... | 02.05.75 | සිකුරාද ... | 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද ... | 02.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද ... | 09.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද ... | 16.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද ... | 23.05.75 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි ... | 06.06.75 | සිකුරාද ... | 30.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද ... | 06.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද ... | 13.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද ... | 20.06.75 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී